**කෝරළෙයි පත්තු උතුර ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කෝරළෙයි පත්තු උතුර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට කෝරළෙයි පත්තු උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මාංකේනි පුස්තකාල අළුත්වැඩියා වියදම් රු.499,109ක්, ජේසීබී යන්ත්‍ර අළුත්වැඩියා වියදම් රු.296,280ක් සහ කායංකේනි මුහුදු ආහාර අලෙවි මධ්‍යස්ථානය (Sea food sales store) විවෘත කිරීමේ උත්සව වියදම් රු.143,670ක් මූලධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙම වටිනාකම් ඉදිරි මූල්‍ය වර්ෂයේ සමුච්චිත අරමුදල් ගිණුමෙන් නිවැරදි කරන බව. | වියදම්වල ස්වරූපය පදනම් කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය ජනතාවට වියළි කාලවලදී පානීය ජලය බෙදා හැරීම වෙනුවෙන් කෝරළෙයි පත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු ප්‍රතිපූර්ණය කළ හැකි රු.109,863ක් ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වටිනාකම ප්‍රතිපූර්ණය කරන අවස්ථාවේදී පමණක් ඒවා ගිණුම්ගත කරන බව. | ලැබිය යුතු දෑ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දැක්විය යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.302,085,077ක ශේෂ 07කට අදාල ස්ථාවර වත්කම් ලේඛන, හිමිකාරිත්වය තහවුරු කිරීමේ ලේඛන සහ අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | වත්කම්වලට අදාල ලේඛන නඩත්තු කර, අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වත්කම්වලට අදාල ලිඛිත සාක්ෂි ලබාගැනීමටත් ලේඛනවල ලේඛනගත කිරීමටත් කටයුතු කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 19(1)(XXIV)(ආ) උපවගන්තිය | සභාව විසින් ආදායම් ඉපැයීමේ අරමුණෙන් සිදු කරන වැලි ගොඩ දැමීමට සහ එම වැලි විකිණීම සඳහා මිල තීරණය කිරීමටත් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදි වැලි ගොඩ දැමීම සහ වෙළෙදාම සහ විකුණුම් මිල නිර්ණය කිරීම ආදිය සහා තීරණය අනුව සිදු කරන බව. | වැලි ගොඩ දැමීම සහ විකුණුම් මිල නිර්ණය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| (ii) | 24(1) වගන්තිය | සභා බලප්‍රදේශයේ මාර්ග 157ක් හඳුනාගෙන තිබුණද, ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. | ඉදිරියේදි පළ කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | ගැසට් පත්‍රය මගින් මාර්ග සලකුණු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2)(ආ) | සභාව විසින් 2018, 2021 සහ සමාලෝචිත වර්ෂය තුළ යන කාල පරිච්ඡේදයේ නිශ්චිත කාර්යයන් සඳහා ලබා දී තිබූ රු.255,000ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා නිරවුල් කර නොතිබුණි. | අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,855,358ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 3,133,210ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,200,000 | 2,124,668 | 928,762 | 1,195,906 | 1,700,000 | 753,593 | 715,117 | 951,006 |
| කුලී | 4,421,200 | 3,254,390 | 2,560,940 | 693,450 | 5,300,000 | 2,008,130 | 1,645,780 | 1,029,250 |
| බලපත්‍ර ගාස්තු | 880,500 | 1,391,300 | 1,346,300 | 45,000 | 755,000 | 948,550 | 973,550 | 82,000 |
| වෙනත් ආදායම් | 3,800,000 | 1,392,677 | 993,727 | 384,000 | 15,406,000 | 29,523,363 | 30,018,070 | 434,000 |
| එකතුව | **10,301,700** | **8,163,035** | **5,829,729** | **2,318,356** | **23,161, 000** | **33,233,636** | **33,352,517** | **2,496,256** |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 සහ 2022 වර්ෂවල ජේසීබී යන්ත්‍ර කුලියට දීමෙන් කුලීහිමියන්ගෙන් රු.444,100ක් අයවිය යුතුව තිබුණි. | කුලීහිමියන්ගෙන් අයකිරීමට කටයුතු කර ඇති බව. | හිඟකුලී අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගංගා වැලි විකිණීම මගින් පනිච්චංකේනි සහ වාකරේ ප්‍රජා පාදක මධ්‍යස්ථානවලින් අයවිය යුතු රු.234,000 ක් වර්ෂ 02කට අධික කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟමුදල් අදාල අයගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | වැලි විකුණුම් හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මදුරංකේනි සහ ආලංකුලම් ප්‍රජා පානිය ජල ව්‍යාපෘතිය යටතේ පානීය ජලය බෙදා හැරීම වෙනුවෙන් සභාවට අයවිය යුතු හිඟ ජල ගාස්තු රු.237,509ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ආලංකුලම් ප්‍රජා පානිය ජල ව්‍යාපෘතිය හිඟමුදල් වර්තමාන යේඅයකරමින් පවතින බව. | හිඟහිටි පානීය ජල ගාස්තු අයකර ගැනීමට පියවර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යන රු.500,000ක් වටිනා ස්ථාවර තැන්පතු ගිණුම් 03කින් නව පොලී වැඩිවීමේ අනුපාතයට අනුව පොලිය ලබාගැනීමට සභාව පියවර ගෙන නොතිබුණි. | මෙම අඩුපාඩු නිවැරදි කිරිමට කටයුතු කරමින් පවතී. | සභාවේ ආදායම් මූලාශ්‍ර මුළුමනින්ම උපයෝජනය කිරීමට පියවර ගතයුතුය. |
| (ආ) | සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල්වලට ගෙවිය යුතු දායක මුදල් පිළිවෙලින් රු. 291,237ක් සහ රු.82,427ක් ගෙවා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | -එම- | සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල්වලට ගෙවිය යුතු දායක මුදල් නියමිත කාල වකවානු තුළ ගෙවීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 49 (අ) වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ ගොඩනැගිලි ඉදිකිරීමේ අනුමැතිය සභාව විසින් ලබා දිය යුතු වුවත්, මඩකලපුව විශ්වවිද්‍යාල ආයතනය විසින් ඉදිකළ ගොඩනැගිලි සංකීර්ණය සම්බන්ධයෙන් කාර්යාලයේ ගොඩනැගිලි අයදුම්කරු විසින් ඉදිරිපත් කළ ගොඩනැගිලි අයදුම්පත්‍රය, ඉඩම් හිමිකම් ඔප්පු, පිඹුරුපත්, සභාව විසින් ලබාදිය යුතු නොපැවරුම් සහතිකය සහ වීථි රේඛා සහතිකය ආදි කිසිදු ලේඛනයක් නොමැතිව සංශෝධිත ගොඩනැගිලි සැලැසුම් පමණක් පදනම් කරමින් සභාව විසින් ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමට අනුමැතිය ලබාදී තිබුණි. | -එම- | පනතේ විධිවිධාන ප්‍රකාරව ලේඛනමය අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසු ගොඩනැගිලි අනුමැතිය ලබාදීමට පියවර ගත යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේදී ලැබී තිබූ පරිගනක පද්ධති 02ක් අක්‍රීය වී පැවැති නමුත් සමාලෝචිත වර්ෂයේ අවසාන වන විටත් ඒවා අළුත්වැඩියා කර නොතිබුණි. | සභාවට අරමුදල් පහසුකම් ලැබූ විට අළුත්වැඩියා කරන බව. | වත්කම් ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සභාව සතු ධාවන තත්ත්වයේ නොමැති වාහන 05 ක් අපහරණය කිරීමටත් අළුත්වැඩියා කළ හැකි වාහන 09ක් අළුත්වැඩියා කිරීමටත් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා තත්ත්වයේ පවතින වාහන සභාවේ අරමුදල් තත්ත්වය සැලකිල්ලට ගෙන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කරමින් පවතින බව. | වාහන අළුත්වැඩියා කිරීමට හා භාවිතා කළ නොහැකි වාහන අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 13 ක් පැවැතුණි. | පුරප්පාඩු සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමුවී ඇති බව. | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කර යුතුය. |
| (ආ) | විශ්‍රාම ගිය නිලධාරීන් 02 දෙනෙකුගේ සහ වැඩ තහනම් කළ නිලධාරියෙකුගේ හිඟ ණය ශේෂය රු. 211,064 ක් වර්ෂ 10කට අධික කාලයක් හිඟහිටිව පැවැතුණි. | අය කිරීමට කටයුතු කර ඇති බව. | හිඟ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1994 වර්ෂයේ මාර්ග පිරිසිදු කිරීමේ කම්කරුවෙකු ලෙස පත්වීම් ලබා 2011 වර්ෂයේ විශ්‍රාම ගිය කම්කරුවෙකුගේ පෞද්ගලික ලිපිගොනුවේ පැවැති අඩුපාඩු සහ වැටුප් වර්ධක ගැටළු නිරාකරණය කර එකී කම්කරුට විශ්‍රාම වැටුප් ලබාදීමට පසුගිය වර්ෂ 12කට අධික කාලයක සිට සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පෞද්ගලික ලිපිගොනුවේ පැවැති අඩුපාඩු නිරාකරණය කර විශ්‍රාම වැටුප් ලබාදීමට කටයුතු කරමින් පවතින බව. | සේවක විශ්‍රාම වැටුප් ලබාදීමට කඩිනමින් පියවර ගත යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ අනුමත කළ අභ්‍යන්තර විගණන සැලැස්මක් සභාව සතුව නොපැවැතුණි. එසේම, සභාවේ අභ්‍යන්තර විගණනයක්ද සිදුකර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | අභ්‍යන්තර විගණන කාර්යයන් සිදුකිරිමට පියවර ගත යුතුය. |